PR/2020/S 10

# ජපන් තානාපති කාර්යාලය

නො.20 ශ්‍රීමත් ආර්.පී.සේනානායක මාවත, කොළඹ 07

දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629
ඊ-මේල්: cultujpn@sltnet.lk

ජූලි 13, 2020

## පුවත්පත් නිවේදනය

### ජපානය ශ්‍රී ලංකාවේ නීති විරෝධී මත්ද්‍රව්‍ය මැඩලීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට ආධාර ප්‍රදානය කරයි

ජපන් රජය විසින් ජපන් යෙන් මිලියන 200ක් (දළ වශයෙන් රුපියල් මිලියන 345 ක්) ශ්‍රී ලංකාවේ නීති විරෝධී මත්ද්‍රව්‍ය මැඩලීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සඳහා ප්‍රදානය කර ඇත. මෙම ව්‍යාපාතියට අදාල හුවමාරු පත්‍ර සඳහා අත්සන් තැබීම, 2020 ජූලි 13 වන දින ජපන් තානාපති සුගියම අකිරා මහතා සහ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා විසින් මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේදී සිදුකරණ ලදී.

මෑත කාලීනව ලංකාවේ මත්ද්‍රව්‍ය හා සම්බන්ධ ක්‍රියාකාරකම් වල වැඩිවීමක් දක්නට ලැබෙන අතර, එය සමාජීය ගැටළුවක් බවට ද පත්වෙමින් ඇත. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම සංවිධානාත්මක අපරාධ සහ පාතාල ක්‍රියාකාරකම් වලට තුඩුදෙන කාරණාවක් වන අතර, එය සමස්තයක් ලෙස තනි පුද්ගලයන්ට මෙන්ම සමාජයටත් සෘණාත්මක බලපෑම් ඇතිකරයි.

ජපන් රජය, ජයිකා (JICA) ආයතනය හරහා ශ්‍රී ලංකා පොලිසියේ ධාරිතා වර්ධනය කිරීමට පුහුණු වැඩසටහන් ද, මත්ද්‍රව්‍ය නැවත භාවිතයට පෙළඹීමට එරෙහිව, නිවැරදි මගපෙන්වීමේ ක්‍රියාකාරකම් සිදුකරනා අයවලුන් හට පුහුණු කිරීම් ද ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය විසින් දැනට ගෙනයනු ලබන වැඩපිළිවෙල වේගවත් කිරීමේ අරමුණින් ජපන් රජය තීරණය කර ඇත්තේ නීති විරෝධී මත්ද්‍රව්‍ය මෙරටට ගලා ඒම අවම කිරීම සඳහා අමතර ආධාර ප්‍රදාන ද ලබාදීමටයි.

මෙම ව්‍යාපාතිය යටතේ ජපන් ව්‍යවසායකයින් විසින් නිෂ්පාදිත නවීන උපකරණ, මත්ද්‍රව්‍ය නැවත වෙළඳාම පිළිබඳ පරීක්ෂණ සිදුකිරීමට හා මත්ද්‍රව්‍ය භාවිතා කර ධාවනයේ යෙදෙන රියදුරන් හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීමට, ශ්‍රී ලංකා පොලිසියේ ශක්‍යතාව වර්ධනය කිරීම සඳහා ප්‍රදානය කරනු ඇත. මේ යටතේ මත්ද්‍රව්‍ය, ඖෂධ සහ පුපුරණ ද්‍රව්‍ය හඳුනාගැනීම විශ්ලේෂණය කිරීමට වායු වර්ණදේහ ස්කන්ධ වර්ණාවලික්ෂය නොහොත් Gas Chromatograph Mass Spectrometer (GC – MS ) ද , සැකකටයුතු අයිතම සෝදිසි කර බැලීමට යොදාගන්නා ජංගම එක්ස් කිරණ ස්කෑනර් යන්ත්‍ර, මත්ද්‍රව්‍ය, ඖෂධ සහ පුපුරණ ද්‍රව්‍ය පිළිබඳ හෝඩුවාවන් අනාවරණය කිරීම සඳහා යොදාගන්නා අතේ රැගෙන යාහැකි රාමන් වර්ණාවලික්ෂ යනාදී පුළුල් පරාසයකින් යුතු උපකරණ රාශියක් ඇතුලත් වේ.

මෙම ප්‍රදානය තුලින් ජපන් රජය දායකත්වය දැක්වීමට බලාපොරොත්තු වන්නේ මත්ද්‍රව්‍ය උවදුර නැමැති දිනෙන් දින වර්ධනය වන අභියෝගය පාලනය කිරීමටත්, මත්ද්‍රව්‍ය වෙළඳාම සහ නැවත විකිණීම ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමටත්, එමගින් නිරෝගීමත්, ආරක්ෂිත, මත් උවදුරින් තොර දේශයක් අනාගත පරපුර වෙනුවෙන් ඇති කිරීමත්ය.(නිමි)

**********************************************************

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.

සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය

දුරකථනය 011-269-3831~3 (දිගු අංකය 224)